## බුදු සමයේ ව්‍යාප්තියට කලාවෙන් සිදුවූ මෙහෙය පිළිබඳ අධ්‍යයනයක්

මෙම ලිපිය බෞද්ධ කලාවේ දියුණුව හා ව්‍යාප්තිය අධ්‍යයනය කරමින් බුදු සමයේ ව්‍යාප්තිය කෙරෙහි කලාවේ දායකත්වය විමසා බලයි. මෙහි දී බෞද්ධ දෘශ්‍යකලා කෙරෙහි පමණක් අවධානය යොමු කරනු ලැබේ.

### භාරතීය බෞද්ධ කලාවේ ආරම්භය හා ව්‍යාප්තිය

ආසියාව පුරා විසිරී ඇති නෂ්ටාවශේෂයන්ගෙන් වැඩි හරිය බුදු සමයට අයත් ය. දුකෙන් මිදමේ විමුක්ති මාර්ගය පෙන්වා දෙන බුදු සමය වැනි ආගමක් මෙතරම් විශාල කලා කෘති සමූහයක් නිපද වූයේ කෙසේ ද යන්න පිළිබඳ වෝගල් වැනි විචාරකයෝ මවිතය පළ කරති.[1]

බුදුන් වහන්සේ ජීවත්ව සිටිය දී ම ආදි බෞද්ධ සමාජයේ කලාත්මක චින්තනය, කලා රසිකත්වය හා සීමා සහිතව කලාත්මක ක්‍රියාවල නියැලීම දැකිය හැකි විය. බෞද්ධ කලාව බුද්ධ කාලීන භික්ෂු සංස්ථාව තුළ ක්‍රමානුකූලව සිදුවූ පරිවර්තනයක ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැක. ආදි ම බෞද්ධ භික්ෂුව පූර්ණ තාපස ජීවිතයක් ගත කළ අතර පිණ්ඩාහාරයෙන් යැපුණු ජීවත් වීම සඳහා ස්ථිර වාසස්ථානයක් නොවූ එසේ ම අල්ප සමාජ සම්බන්ධතා ඇත්තේ හෝ සමාජ සම්බන්ධතාවලින් පූර්ණ වශයෙන් වියුක්ත වූයේ විය. බෞද්ධ සාහිත්‍යයේ පැරණි ම කොටසක් වන *සුත්තනිපාතයේ* අට්ඨක හා පාරායණ වග්ගවලින් මූර්තිමත්වන භික්ෂුව මෙබඳු ස්වරූපයේ අයෙකි. භික්ෂුවගේ කගවෙහෙණහගක් මෙන් හුදෙකලාව හැසිරීම (එකො චරෙ ඛග්ගවිසාණකපෙපා) උත්කෘෂ්ට චර්යාවක් ලෙස හුවා දක්වා ඇති මෙහි ප්‍රගතිශීලී නොහොත් සමාජශීලී භික්ෂූන් පිළිබඳ නොකියවේ. පහත උදාහරණයෙන් පැරණි බෞද්ධ භික්ෂු සමාජයේ හුදෙකලා තාපස ජීවිතය මැනවින් නිරූපණය වේ.

*සංසග්ග ජාතස්ස භවන්ති ස්නේහා*
*ස්නේහන්වයං දුක්ඛමිදං පහොති*
*ආදීනවං ස්නේහජං පෙක්ඛමානො*
*එකො චරෙ ඛග්ගවිසාණ කප්පෝ*[2]

(හටගත් (දර්ශනාදී) සංසර්ග ඇති භික්ෂුවට ස්නේහයෝ උපදනාහ. මේ (ශෝකාදී) දුක ස්නේහ පරම්පරානුගතව උපදනේය. ස්නේහයෙන් උපන් ආදීනව දකිමින් කගවෙහෙණහගක් සෙහින් එකලාව හැසිරෙන්නේය)

ධර්මප්‍රචාරක කටයුතුවල නියැලීම, භික්ෂු සංස්ථාවේ ව්‍යාප්තිය භික්ෂු සංස්ථාව පිළිබඳ වර්ධනය වූ කීර්තිය වැනි කාරණා නිසා කාලානුරූපව භික්ෂුව හා සාමාන්‍ය ජනයා අතර සම්බන්ධය දැඩි විය.

---

[1] Vogel, J., . *Buddhist Art In India Ceylon and Java*. New Delhi, 1977. P 01

[2] සුත්තනිපාත (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා) ඃ 12